www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පක්ෂ සාමාජිකයා අතුරුදහන් වීම සම්බන්ධයෙන් පිලිතුරු දෙන ලෙස ඉල්ලමින් සසප ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් වෙත ලිපියක් ලියයි

## SEP writes to Sri Lankan defence secretary demanding answers on disappearance of party member

**2007 අප්‍රේල් 28**

*පහත පල වන්නේ, සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් අතුරුදහන් වීම සම්බන්ධයෙන් කිසිදු බැරෑරුම් පරීක්ෂනයක් පැවැත්වීමට පොලීසිය හෝ ආරක්ෂක අමාත්‍යංශය අපොහොසත් වීමට විරෝධය පල කරමින් ඊයේ සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් විසින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් වෙත යවන ලද ලිපිය යි. ප්‍රදේශවාසීන් විසින් ඔවුන් අන්තිමට දකිනු ලැබ සති පහකටත් වැඩි කලක් ගත වී ඇතත් ඔවුන් දෙදෙනා අත් අඩංගුවට ගත් බවක් තහවුරු කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ආරක්ෂක හමුදාවෝ තවමත් සමත්ව නැත. නාවික හමුදාව සහ කොලඹ පාලක සභාග ආන්ඩුවේ කොටස්කරුවකු වන ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් ඔවුන් දෙදෙනා අතුරුදහන් වී ඇති කොන්දේසි ව්‍යාකුල කිරීමට දරන ලද ප්‍රයත්නයන් පිලිබඳ නව සාක්ෂ්‍ය ලිපිය මගින් විස්තර කෙරේ.*

*විමලේස්වරන් හා මදිවදනන් සොයා දෙන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකාවේ බලධාරින් වෙත ලිපි යවන ලෙස සසප ජාත්‍යන්තර පරිමාන සිය සියලු ආධාරකරුවන්ගෙන් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන්ගෙන් ඉල්ලා සිටී. ලිපිය යැවිය යුත්තේ:*

*ගෝඨාභය රාජපක්ෂ,*
*ආරක්ෂක ලේකම්,*
*15/5, බාලදක්ෂ මාවත,*
*කොලඹ 3, ශ්‍රී ලංකාව.*
*ෆැක්ස්: 0094-11-2541529.*

*එන්.ජී. පුංචිහේවා,*
*අධ්‍යක්ෂ-පැමිනිලි හා පරීක්ෂන,*
*ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂම,*
*අංක 36, කින්සි පාර,*
*කොලඹ 8, ශ්‍රී ලංකාව,*
*ෆැක්ස්: 0094-11-2694924.*

*ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත එවිය යුතු ය.*

*සමාජවාදී සමානතා පක්ෂය,*
*තැ.පෙ. 1270,*
*කොලඹ. ශ්‍රී ලංකාව,*
*ඊ-මේල්: wswscmb@sltnet.lk*

ගෝඨාභය රාජපක්ෂ,
ආරක්ෂක ලේකම්,
15/5, බාලදක්ෂ මාවත,
කොලඹ 3, ශ්‍රී ලංකාව.

2007 අප්‍රේල් 27

ප්‍රිය රාජපක්ෂ මහතානෙනි,

කයිට්ස් දිවයිනේ පදිංචිකරුවන් වන සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිතුරු සිවනාදන් මදිවදනන් මාර්තු 22 දා අතුරුදහන් වීම සම්බන්ධයෙන් සසප 2007 මාර්තු 24 දා ඔබ වෙත නිල පැමිනිල්ලක් ඉදිරිපත් කලේ ය. මොවුන් දෙදෙනා සොයා ගැනීම පිනිස හදිසි පරීක්ෂනයක් ආරම්භ කරන ලෙස එහි දී අපි ඔබගෙන් ඉල්ලා සිටියෙමු. ඔවුන්ගේ අතුරුදහන් වීමට නාවික හමුදාව සහ ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (ඊපීඩීපී) සම්බන්ධ බවට සසප සැක කරන බව ද අපි ඔබට දැනුම් දුන්නෙමු.

විමලේස්වරන් හා මදිවදනන් අතුරුදහන් වීමෙන් සති පහකට පසුවත් කිසිදු නිල පරීක්ෂනයක් ඇරඹී ඇති බවට මොනම සාක්ෂ්‍යයක් වත් නැත. මෙය කිසිසේත්ම පිලිගත නොහැකි තත්වයක් වන අතර ඔවුන්ට සිදු වූයේ කුමක්ද යන්න පිලිබඳ තොරතුරු අපට සපයන ලෙස අපි යලිදු වතාවක් ඔබගෙන් ඉල්ලා සිටිමු.
අපගේ ම පරීක්ෂනවලට අනුව, ඔවුන් දෙදෙනා මදතුවේලි ගමේ මිතුරකුගේ නිවසකින් ඇඳුම් කිහිපයක් රැගෙන මාර්තු 22 දා සවස 6.30ට පමන පුංගුඩුතිව් දිවයිනේ සිට කයිට්ස් දිවයින කරා ආපසු යනු පිනිස දිග මුහුදු පාලම දෙසට යතුරු පැදියකින් ගමන් කරන ආකාරය ප්‍රදේශවාසීන් අවසාන වතාවට දැක ඇති බව අපි දනිමු.

ඔවුන් දෙදෙනා සවස 5.30ට පුංගුඩුතිව් දිවයිනට ඇතුලු වී සවස 6.30ට පමන දිවයිනෙන් පිටත් වූ බවට නාවික හමුදා මාර්ග බාධකයේ සටහන්ව ඇතැයි පුංගුඩුතිව් දිවයිනේ ගෝඨයිම්බර කඳවුරේ නාවික අන දෙන නිලධාරියා සහතික කර තිබේ. කෙසේ වෙතත්, මුහුදු පාලමේ අනෙක් කෙලවරේ මාර්ග බාධකය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වගකීම දරන කයිට්ස්හි වේලනෙයි කඳවුරේ නාවික අන දෙන නිලධාරියා තමන් ඔවුන් දෙදෙනා අත් අඩංගුවට නොගත් බව කීම හැර ඔවුන් ගැන කිසිවක් පැවසීම ප්‍රතික්ෂේප කර ඇත.

පසු ගිය මාසය මුලුල්ලේ අප දුරකතන ඇමතුම් ගනනාවක් ම දී ඇතත් එය නොතකා, පොලීසිය හා මිලිටරිය මාර්තු 22 දා සවස කයිට්ස් මාර්ග බාධකයේ දී කුමක් සිදු වූයේ ද යන වග සසපට තවමත් පවසා නැත. නාවික හමුදාවට අනුබද්ධිත සිවිල් ඇඳුමෙන් සැරසුනු නිලධාරින් දෙදෙනෙකු එහි සිටි බවත් ඔවුන් විමලේස්වරන් හා මදිවදනන් පුංගුඩුතිව් දෙසට යන විට ඔවුන්ගෙන් ප්‍රශ්න කොට ශරීර පරීක්ෂාවකට ලක් කල බවත් අපගේ ම මූලාශ්‍ර වෙතින් අපි දැන ගතිමු.

ප්‍රදේශය තුල වක්කන් රාසන් යන නමින් දන්නා, හිටපු ඊපීඩීපී සාමාජිකයකු වන සිදම්බරපිල්ලෙයි චන්ද්‍රසේකරන් අතුරුදහන් වූ දෙදෙනාගේ බිරින්දෑවරුන්ට කතා කොට ඔවුන්ගේ සැමියන් මිලිටරි අත් අඩංගුවේ පසු වන බව පවසමින් ඔවුන් දෙදෙනා නිදහස් කර ගනු පිනිස සාවද්‍ය ප්‍රකාශ කරන ලෙස ඔවුන් දිරිගැන්වීමේ යෙදී සිටින බව දැන් අපගේ අවධානයට යොමුව පවතී. නාවික හමුදාව සමග සමීප සබඳකම් පවතින රාසන් දැන් ජීවත් වන්නේ විශාල වසයෙන් නාවික හමුදාව රදවා ඇති ප්‍රදේශයක් වන වේලනෙයි පෙදෙසේ තුරෙයියුර්හි ය.

රාසන් මුලින් ම මදිවදනන්ගේ බිරිඳ වන සුලක්ෂනා මදිවදනන් හමු වී ඇගේ සැමියා සොයා ගැනීමට තමන් උත්සාහ දරන බව පවසා තිබේ. තමන් ක්‍රියා කරන්නේ ඊපීඩීපී යාපනය කාර්යාලයේ සේවය කරන ඊපීඩීපී නිලධාරියකු වන මදිවදනන්ගේ පියා වෙනුවෙන් බව ද ඔහු කියා පා තිබේ. මුදල් ගෙවීමක් අවශ්‍ය විය හැකි බවක් ද ඔහු අඟවා තිබේ. එමගින් ඔහු අවධානය යොමු කරන්නේ, යාපන දිස්ත්‍රික්කයේ කුප්‍රකට භාවිතාවක් බවට පත්ව ඇති, මිලිටරිය විසින් රඳවා ගෙන සිටින රැඳවියන් නිදහස් කර ගනු පිනිස රුපියල් දස දහස් ගනනින් අල්ලස් දීම දෙසට යි.

අප්‍රේල් 10 දා රාසන් සුලක්ෂනාගෙන් ලිපියක් ලබා ගත්තේ ය. සිය සැමිය හා විමලේස්වරන් අතුරුදහන් වීම වටා වූ කොන්දේසි ඇය එය තුල විස්තර කලා ය. එම ලිපිය වේලනෙයි නාවික හමුදා නිලධාරින්ට පෙන්වීමට තමන්ට අවශ්‍ය යැයි රාසන් පැවසී ය. පසු දින යලි පැමිනි රාසන් රැඳවියන් දෙදෙනා බලනු පිනිස තමා සමග පේදුරු තුඩුවට යාමට සූදානම් වන ලෙස සුලක්ෂනාට පැවසී ය.

අප්‍රේල් 12 දා රාසන් සුලක්ෂනා සහ විමලේස්වරන්ගේ බිරිඳ වන සිවාජිනී විමලේස්වරන් හමු විය. විමලේස්වරන්ගේ සිද්ධිය අසීරු කාරනයක් බව ප්‍රකාශ කල ඔහු මුලින් මදිවදනන් නිදහස් කර ගැනීමට උදව් කිරීමට පොරොන්දු විය. තමා සමග "එක්තරා ස්ථානයකට" පැමිනෙන ලෙස ඔහු කාන්තාවන් දෙදෙනාට පැවසී ය. සිය සැමියන් දෙදෙනා ඇඳුම් රැගෙන ඒමට ගිය බවක් නොකියා ඔවුන් මසුන් මැරීමට ගොස් පමා වී ආපසු පැමිනිය බව පවසන ලෙස ඔහු විමලේස්වරන්ගේ බිරිඳට කීවේ ය.

බොරු කීම හෝ රාසන් සමග නොදන්නා ස්ථානයකට යාම කාන්තාවෝ ප්‍රතික්ෂේප කලහ. තමා දන්නා දෙය මානව හිමිකම් කොමිෂමට හා සෙසු ආයතනවලට යොමු කල නිල පැමිනිලිවල දැනටමත් සඳහන් කර ඇතැයි විමලේස්වරන්ගේ බිරිඳ පෙන්වා දුන් කල එම ලියවිලි ආපසු රැගෙන දීමට තමන්ට හැකි යැයි රාසන් පැවසී ය.

කාන්තාවන් රාසන් යෝජනා කල සාවද්‍ය ප්‍රකාශ සිදු කලේ නම්, ඔවුන් සිය සැමියන් ප්‍රදේශය තුල බල පවත්වන මිලිටරි රෙගුලාසි බිඳ ඇති බවට චෝදනාවන්ට හසු කලා වනු ඇත. එනම් සවස 4 සිට පසු දින උදෑසන 7 දක්වා ධීවර කටයුතුවලට පනවා ඇති තහනම සහ රාත්‍රී 8 සිට පසුදා උදෑසන 6 දක්වා බල පවත්නා ඇඳිරි නීතිය යි. මදිවදනන් හා විමලේස්වරන් මෙම එකදු රෙගුලාසියක් වත් කඩ කර ඇති බවට කිසිදු සාක්ෂ්‍යයක් නැත.

රාසන්ගේ උපදෙස් අනුව කටයුතු කරන ලෙස සිය බිරිඳගෙන් ඉල්ලා සිටිමින් මදිවදනන් විසින් ලියන ලදැයි කියනු ලැබූ ලිපියක් ද ඉදිරිපත් කරමින්, තමන් සමග සහයෝගී වන ලෙස කාන්තාවන් දෙදෙනා පොලඹවා ගැනීමට රාසන් අප්‍රේල් 14 දා තවත් උත්සාහයක් දැරී ය. සුලක්ෂනාට අනුව, එම ලිපිය පැහැදිලිව ම බොරුවක් වූයේ මදිවදනන්ට ලිපි ලිවිය නොහැකි බැවිනි.

රාසන්ගේ ක්‍රියා අනතුරු අඟවන සුලු ගැටලු මතු කරයි. පලමුව, වේලනෙයි කඳවුරේ නාවික හමුදා නිලධාරින් සමග තමන්ට සමීප සබඳතා පවතින බව ද විමලේස්වරන් හා මදිවදනන් මිලිටරිය විසින්, බොහෝ විට පේදුරු තුඩුවේ කඳවුරක, රඳවා ගෙන සිටින වග තමන් දන්නා බව ද ඔහු පෙන්නුම් කරයි. දෙවනුව, මදිවදනන්ගේ බිරිඳගේ ලිපියේ අන්තර්ගතය සම්බන්ධයෙන් ඔහු සිය නාවික හමුදා සබඳතාවල අදහස් විමසා ඇති බව ද ඉන් පසුව සිය කතාව වෙනස් කරන ලෙස ඉල්ලමින් කාන්තාවන් වෙත ප්‍රවිෂ්ට වූ බව ද පෙනී යයි.

වේලනෙයි නාවික හමුදා නිලධාරින් සමග රාසන්ට පවත්නා සබඳතාව කුමක් ද? බොරු කියන ලෙස අතුරුදහන් වූ දෙදෙනාගේ බිරින්දෑවරුන් පොලඹවා

ගැනීමට ඔහු දැරූ උත්සාහයට නාවික හමුදාව වගකිව යුතු ද? එසේ නම් ඒ ඇයි? අපගේ උද්ඝෝෂනය මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගොනු කර ඇති සැලකිය යුතු ජාත්‍යන්තර අවධානයට ප්‍රතිචාර වසයෙන්, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ නීති විරෝධී ක්‍රියාවන් යට ගසනු පිනිස ව්‍යාකූලත්වයක් නිර්මානය කිරීමට සිතා මතා ම උත්සාහයක යෙදී ඇතැයි සසප උත්සුකව සිටී.

අප්‍රේල් 15 දා සිදු වූ වෙනත් සිද්ධියක් මගින් අපගේ භීතිය වැඩි දියුනු විය. එදින සවස 4.45ට පමන නාවික හමුදා ඔත්තු අංශයේ නිලධාරින් ලෙස තමන් හඳුන්වා ගත් දෙදෙනෙක් මදිවදනන්ගේ බිරිඳ සොයා ගෙන පැමිනියේ ය. මොන යම් හෝ පරීක්ෂනයක් සිදු කිරීමට මෙතෙක් කල පමා වීම ගැන කරුනු පැහැදිලි කරමින්, තමන් නිවාඩු ගොස් සිටි බවත් එහෙත් දැන් විමලේස්වරන්ගේ හා මදිවදනන්ගේ අතුරුදහන් වීම ගැන සොයා බලන බවත් ඔවුහු කියා සිටියහ.

ඔවුන්ගේ මූලික උත්සුකතාව වූයේ මදිවදනන්ගේ දේශපාලනික සම්බන්ධකම් ය. ඔහු සසප සාමාජිකයෙක් ද? සසප නිල පැමිනිල්ලක් කර ඇති බව ඔවුහු දැන සිටියහ. මදිවදනන් සසප සාමාජිකයකු නොවන බව සුලක්ෂනා පැහැදිලි කලා ය. ඔවුන් දෙදෙනා පුංගුඩුතිව් සිට කයිට්ස් බලා ආපසු එමින් සිටියේ ද නැත හොත් යාපන නගරයේ සිට ආපසු එමින් සිටියේ ද යන වග ද ඔවුහු විමසූහ. සුලක්ෂනා පුංගුඩුතිව් යනුවෙන් පිලිතුරු දුන්නේ, ඔවුන් දෙදෙනා සවස 6.30ට එම දිවයිනෙන් පිටත් වූ බව පුංගුඩුතිව් අන දෙන නිලධාරියා තමන් සමග පවසා ඇති බව ද පෙන්වා දෙමිනි. "එහෙම නම් අපේ කට්ටිය (වේලනෙයි) පාලම ලඟදි ඒ ගොල්ල (අත් අඩංගුවට) ගන්න ඇති," යැයි එක් නාවික ඔත්තු සේවා නිලධාරියෙක් පැවසී ය.

මෙය ඔවුන් දෙදෙනාගේ අතුරුදහන් වීම ගැන කෙරෙන නාවික හමුදා පරීක්ෂනයක ආරම්භය ද? එය එසේ නම්, සසප සහ ඔවුන්ගේ පවුල්වලට එය නිල වසයෙන් දැනුම් නොදුන්නේ මන්ද? සති තුනකටත් වඩා කලක් පමා වූයේ ඇයි? මේ සිද්ධිය සම්බන්ධයෙන් කටයුතු කිරීම භාරව සිටින්නේ පොලීසිය යැයි ඔබගේ කාර්ය මන්ඩලය සසපට විශේෂයෙන් ම දැනුම් දී ඇති තතු තුල ඒ සම්බන්ධයෙන් නාවික ඔත්තු සේවා නිලධාරින් මැදිහත් වන්නේ ඇයි? ඔවුන් දෙදෙනාට සිදු වූ දෙය ගැන උනන්දු වනවා වෙනුවට ඔවුන්ගේ දේශපාලනික සම්බන්ධකම් ගැන විශේෂ උනන්දුවක් දක්වන්නේ මන් ද? සසප සාමාජිකත්වය පරීක්ෂනයට දක්වන සම්බන්ධය කුමක් ද?

තව දුරටත් ගත් කල, කයිට්ස් දිවයිනේ ආරක්ෂාව සම්බන්ධයෙන් වග කිව යුතු වේලනෙයි නාවික හමුදා කඳවුර සහ කයිට්ස් පොලීසිය භාර නිලධාරින්ගෙන් නාවික හමුදා ඔත්තු සේවා නිලධාරින් ප්‍රශ්න කලා ද? එසේ නම්, ඔවුන්ට ලැබුනු පිලිතුරු මොනවා ද? ඔවුන් අදාල නිලධාරින්ට කතා කර නැති නම් ඒ ඇයි?

විමලේස්වරන් හා මදිවදනන් අතුරුදහන් වී මාසයකට වඩා ගත වී ඇත. විධිමත් පරීක්ෂනයක් කිරීමට ඔබ අපොහොසත් වීම, ඔවුන් දෙදෙනාගේ ජීවිත නොවේ නම් ඔවුන්ගේ ශරීර සෞඛ්‍යය හා යහ-පැවැත්ම බරැරුම් ලෙස අනතුරට ලක් කල හැකි ය. ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එච්.කේ. බාලසූරිය මහත්මිය අපට දන්වා ඇත්තේ, ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරින් මේ සිද්ධිය ගැන සොයා බලන බව පමනි. තවත් අතිරේක ලේකම්වරයකු වන සුනිල් එස්. සිරිසේන මහතා අපට පැවසුවේ, අතුරුදහන් වීම ගැන සොයා බලනු පිනිස තමන් නාවික හමුදාපතිට දැනුම් දෙන බව යි. ත්‍රස්තවාදී සැකකරුවන් යයි කියනු ලබන පුද්ගලයන්ගෙන් ප්‍රශ්න කිරීම හා ඔවුන් රඳවා ගැනීම සම්බන්ධයෙන් වග කිව යුතු ආයතනය වන ත්‍රස්ත විමර්ශන ඒකකය (ටීඅයිඩී) තමන් ඔවුන් දෙදෙනා රඳවා ගෙන සිටින්නේ ද නැද්ද යන වග තවමත් තහවුරු කර නැත. උතුරු කලාපය භාර නියෝජ්‍ය පොලිස්පති (ඩීඅයිජී) සහ යාපනයේ ඩීඅයිජී තමන්ගේ පරීක්ෂන සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කලේ ය. කිසිදු තොරතුරක් හෙලි නොකරන ලෙස තමන්ට "ඉහලින්" අන ලැබී ඇතැයි කයිට්ස් පොලීසිය භාර නිලධාරියා අපට පැවසී ය.

අතිශයින් ම මූලික පිලිතුරු සැපයීමට ඔබගේ අමාත්‍යාංශය අපොහොසත් වීම ගැන සසප සිය බලගතු විරෝධය පල කර සිටී. ඔවුන් දෙදෙනා රඳවා ගෙන සිටින්නේ ද එසේ නම් ඒ කවුරුන් විසින් ද මක් නිසා ද යන වග අපට දැනුම් දෙන ලෙස අපි ඉල්ලා සිටිමු. ඔවුන් දැනට රඳවා ගෙන සිටින්නේ කොහි ද? කුමන කොන්දේසි යටතේ ද?

විමලේස්වරන් හා මදිවදනන් රඳවා ගෙන සිටින්නේ නම් ඔවුන් වහාම නිදහස් කරන ලෙස අපි ඉල්ලා සිටිමු. ඔවුන් දෙදෙනා කිසිදු නීතියක් බිඳ නැති අතර එබැවින් ඔවුන් රඳවා ගෙන සිටින්නේ නීති විරෝධී ආකාරයෙනි. ඔවුන් රඳවා ගෙන නැති නම්, ඔවුන් සොයා ගැනීමට ඔබගේ අමාත්‍යාංශය හා පොලීසිය ගෙන ඇති පියවර සම්බන්ධයෙන් පූර්න පැහැදිලි කිරීමක් අවශ්‍ය යැයි අපි අවධාරනය කර සිටිමු. එම විකල්ප දෙකේ දී ම, ඔවුන්ගේ ආරක්ෂාව හා යහ-පැවැත්ම සම්බන්ධයෙන් ඔබ මුලුමනින් ම වගකිව යුතු යැයි අපි කියා සිටිමු.

සසප මෙම ලිපියට ඉක්මන් හා සතුටුදායක පිලිතුරක් බලාපොරොත්තු වේ.

මීට,

අවංක,

විජේ ඩයස්,

ප්‍රධාන ලේකම්,

සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව).